# අහසින් වැටුනු මීයා



එනක්ෂි උමේදා විතාරණ

# අහසින් වැටුනු මීයා

එනක්ෂි උමේදා විතාරණ



# අහසින් වැටුනු මීයා

© එනක්ෂි උමේදා විතාරණ
කර්තෘ ප්‍රකාශයකි.

ප්‍රථම මුද්‍රණය : 2025 ජනවාරි

**ISBN 978-624-208-232-5**

කර්තෘ : එනක්ෂි උමේදා විතාරණ

# පිදුම

සැමදා සෙවනැල්ලක් වූ ලලිතා ගුරුතුමියට

හා දෙමාපියන්ට සෙනෙහසින් පුදමි.

# ස්තූතිය

කතන්දර පොත ලිවීමට මා උනන්දුකළ

දෙමාපියන්ට මාගේ හදපිරි ස්තූතිය පුදමි.

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡෙද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **"හෙරණගත්කරණී"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රිය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

එකොමත් එක කාලයක බොහෝම සිල්වත් තාපසවරයෙක් ජීවත් වුණා. එතුමා භාවනා කරලා සිත දියුණු කරගෙන හාස්කම් කරන්න පුලුවන් කෙනෙකි. දවසක් කෑම කන්න ගසක් යට වාඩි වුණා.

අහසේ පියඹා ගිය කාක්කෙක් හොටෙන් මීයකු අරගෙන ගියා. කපුටගේ හොටෙන් මීයා බිමට වැටුනා. මීයා වැටුනේ තාපසතුමා වාඩිවී සිටි තැනටමයි.



එතුමා මීයාට කරුණාව දැක්වූවා. කෑම වතුර ලබාදුන්නා. ඉන්පමසු මීයාත් එම ආරාමයේම ජීවත් වුණා. දවසක් පූසෙක් මීයා පිටුපස පන්නාගෙන ආවා. තාපසතුමා හිතුවා පූසා මීයා මරයි කියා, බය උනා.

තාපසතුමාගේ බලයෙන් මීයාව පූසෙක් බවට පත් කළා. පූසෙක් වුන මීයාට අනෙක් පූසන්ගෙන් කරදරයක් උනේ නෑ.



තවත් දවසක බල්ලෙක් පූසා පිටුපස පන්නාගෙන ආරාමයට ආවා. එය දැකපු තාපසතුමා පූසාව බල්ලෙක් බවට පත්කළා. දැන් බල්ලන්ගෙනුත් කරදරයක් නැහැ.


තවත් දවසක් කොටියෙක් ඇවිත් මේ බල්ලාව බය කළා. තාපසතුමා බල්ලා කොටියෙක් බවට පත්කළා. කාක්කාගේ හොටෙන් වැටිච්ච පුංචි මීයා දැන් කොටියෙක් තාපසතුමා මේ කොටියට සලකන්නේ පුංචි මීයාට සැලකුවා වගේමයි.



ගමේ මිනිස්සු දර කඩන්න කැලේට ගියේ ආරාමය ලගින්මයි. කොටියා ආරාමයේ ඉන්නවා ගමේ මිනිස්සු දැක්කා. ගමේ මිනිස්සු කියනවා අර ඉන්නේ කොටියෙක් නෙවෙයි. කාක්කෙක් හොටෙන් මීයෙක් අරන් යද්දි ආරාමය ලඟදී වැටුනු ඒ මී පැටියා තාපසතුමා කොටියෙක් බවට පත් කළේ. අපි බය වෙන්න හොඳ නෑ. මේ කතාව ඇහුනු කොටියාට කේන්ති ගියා.



කොටියා කල්පනා කළා. මේ තාපසතුමා ඉන්නකල් මගේ මේ කතාව නැති වෙන්නේ නැහැ. ඒ නිසා තාපසතුමාව මරලා දාන්න ඕනෑ. තාපසතුමා මරන්න හිතාගෙන කොටියා තාපසතුමා ළඟට ගියා. ඒ වෙලාවේ තාපසතුමා කොටියාගේ හිතේ තියන දේ දැනගත්ත.



තාපසතුමා කෑගහලා කීවා නැවතත් මීයා බවට පත්වෙන්න කියලා. කොටියා නැවතත් මීයා බවට පත් උණා. තාපසතුමා ගොඩක් අනුකම්පාවෙන් කුඩා මීයා දිහා බැලුවා එදා ඉදන් මීයා වෙනත් සතුන්ගේ කරදර, හිරිහැර විද විද ජීවත් උණා.

ලොකු වුනත් පොඩි වුනත් කවදාවත් මුල අමතක කරන්නවත් ආඩම්බර වෙන්නවත් හොඳ නැහැ.

නිමි.



# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශිය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.
මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.
මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්